සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 07 - 2023

## පුරවැසි අධ්‍යාපනය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් ලකුණු 40 ක් හිමි වේ.

- ප්‍රශ්න අංක 1 - 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(ප්‍රතික්ෂේප, සංස්කෘතිය, මානව, ගෞරවාන්විතව, සමාජයක් )

01) පවුල් ඒකක රාශියක එකතුවෙන් ජන........................................ නිර්මාණය වේ.

02) පුද්ගලයාට තම ජිවිතය යහපත්ව හා ....................................... ගත කිරීමට අයිතිවාසිකම් ලබාදීම මගින් ඉඩප්‍රස්ථා සකසා ඇත.

03) මිනිසා උතුම් සම්පතක් වීමට ....................................... ගුණාංගවලින් පිරිපුන් විය යුතුය.

04) සදාචාරාත්මක යුතුකම් පැහැර හරින්නන් පිරිහීමට හා ....................................... වීමට ලක් වේ.

05) සමාජයක මිනිසුන් පිළිගත් පොදු හැසිරීම් රටාවකට හුරුපුරුදු කරනු ලබන්නේ ................................. මගිනි.

- ප්‍රශ්න අංක 6 - 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ හරිනම් ( ✓ ) ලකුණ ද වැරදිනම් ( × ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06) රාජ්‍ය හෝ පුද්ගලික අංශයෙහි සේවයේ නියුතු වෘත්තිකයන්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා නිතිරීති රැසක් ක්‍රියාත්මක වේ. (    )

07) පුද්ගලයා මුහුණදෙන අභියෝග සාර්ථකව ජය ගැනීමට පුද්ගලයා තුළ පවතින දුර්වලතා වර්ධනය කරගත යුතුය. (    )

08) පුද්ගලයන්ගේ යහපත සඳහා පවත්නා පොදු දේපළ පරිහරණය කරමින් ආරක්ෂා කිරීම පුරවැසියාට පැවරී ඇති වගකීමකි. (    )

09) සංස්කෘතික දායාදයන් ආරක්ෂා නොවීම නිසා අතීත උරුමයන් පිළිබඳ අභිමානය වර්ධනය වේ. (    )

10) පාසල එක් පරම්පරාවකින් තවත් පරම්පරාවක් වෙත සංස්කෘතිය පවරා දෙන ආයතනයක් වේ. (    )

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති වරණ අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.**

11) කායික හා මානසික සුවතාව ගොඩනැගීම සඳහා ඔබට කළ හැකි කාර්යයක් වන්නේ,

1. අසල් වැසියන් සමග නිතර නිතර කළහකිරීම.
2. ක්‍රීඩා කටයුතු වලින් ඈත්වීම.
3. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරත වීම.
4. අසභ්‍ය වීඩියෝ දර්ශන නැරඹීම.

12) පුද්ගලයෙකු තුළ හදිසි කෝපයක් ඇති වූ විට ප්‍රකාශ නොවන ඉරියව්වක් වන්නේ,

1. අතපය වෙව්ලීම.
2. මුහුණ රතු වීම.
3. සුහදශීලිව කතා කිරීම.
4. ආවේගශීලි ලෙස කතා කිරීම.

13) "දැනුම, ඇදහිලි, කලා, නීති, සිරිත් විරිත්, ඇගයීම් හා මිනිසා විසින් සමාජයේ ජීවත්වන පුද්ගලයෙකු වශයෙන් ලබා ගන්නා වූ පුරුදු - ඇබ්බැහිකම් හා හැකියාවන්ගේ සමස්තය සංස්කෘතියයි." යනුවෙන් ප්‍රකාශ කරන්නේ,

1. ඊ. බී. ටයිලර්
2. ඒබ්‍රහම් ලින්කන්
3. සීලර්
4. ගානර්

14) සංස්කෘතික දායාද ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාකාරීව කටයුතු කරන ආයතනයකි,

1. අධ්‍යාපන දෙපාර්තමේන්තුව
2. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
3. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
4. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

15) ජාතික කොඩියේ දැක්වෙන කහපාට සිංහ රූපය තුළින් සංකේතවත් වන්නේ,

1. ධාර්මික බව
2. සිංහල ජාතිය
3. සමානාත්මතාව
4. එකමුතුකම

- **ප්‍රශ්න අංක 16 -20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.**



A

16) A පින්තූරයෙන් දැක්වෙන චාරිත්‍රය නම් කරන්න.

.......................................................................................................

17) එම චාරිත්‍රය හා සම්බන්ධ උත්සවය ලියා දක්වන්න.

.......................................................................................................

18) B පින්තූරයෙන් දැක්වෙන්නේ අපේ රටේ අනන්‍යතාව පිළිබිඹු කරන

සංකේතයක් වන ........................................................................ යයි.



B

19) එහි හිමිකාරිත්වය හා භාවිත කිරීමේ අයිතිය හිමිවන්නේ

............................................... තුමාට ය.

20) එම පින්තූරයෙහි දැක්වෙන පහත අංගවලින් සංකේතවත් වන දෑ නම් කරන්න.

වී කරල් .......................................................................................................

පුන් කළස .......................................................................................................

## II - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු ලියන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක්ද, අනෙක් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.

01) i. යහගුණයෙන් පිරි ස්ථාවර ජන සමාජයක පැවැත්මට පදනම සකසන පවුල් ඒකකවල තිබිය යුතු ගුණාංග 2ක් ලියන්න.

1. ..................................................................... 2. .....................................................................

(ලකුණු 02)

ii. ආත්මාභිමානය ඇතිවීම කෙරෙහි බලපාන ගුණාංග 3ක් නම් කරන්න.

1. ..................................................................... 2. .....................................................................

3. ..................................................................... (ලකුණු 03)

iii. සිසුන් තුළ යහපත් ගුණාංග වර්ධනය කිරීම සඳහා පාසල තුළ ක්‍රියාත්මක කළහැකි වැඩ සටහන් දෙකක් පහත දැක්වේ. එම වැඩසටහන්වල දී ඔබට ලැබෙන ගුණ ධර්ම ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| වැඩ සටහන | සිසුන් තුළ වර්ධනය වන ගුණ ධර්ම |
|---|---|
| සීල භාවනා වැඩසටහන | 1. ..................................................................... <br> 2. ..................................................................... |
| ශ්‍රමදාන වැඩසටහන | 1. ..................................................................... <br> 2. ..................................................................... |

(ලකුණු 04)

iv. දුම්වැටි, මත්ද්‍රව්‍ය ආදිය භාවිතයට හුරුවීම නිසා පුද්ගලයෙක් පිරිහීමට පත්වෙන ආකාර 3ක් ලියන්න.

1. .....................................................................................................................................

2. .....................................................................................................................................

3. .....................................................................................................................................


(ලකුණු 03)

v. ඇසුරුම් කළ ආහාර භාවිතයට පෙර අවධානය යොමුකළ යුතු කරුණු 4ක් ලියන්න.

1. ..................................................................... 2. .....................................................................

3. ..................................................................... 4. .....................................................................

(ලකුණු 04)




02) i. ඉහත පින්තූරයෙන් දැක්වෙන්නේ අන්තර් සම්බන්ධතා පැවැත්වෙන ආකාරයකි. එම පින්තූරයේ A, B, C, D වලින් දැක්වෙන සාමාජිකයින් නම් කරන්න.

A ..................................................................... B .....................................................................

C ..................................................................... D .....................................................................

(ලකුණු 04)

ii. පවුල් පරිසරයේ හැදී වැඩී පාසල වෙත යොමුවන දරුවන්ට පාසලේ ගුරුභවතුන්ගෙන් සිසුන්ට ඉටුවිය යුතු යුතුකම් හා සිසුන්ගෙන් ගුරුවරුන්ට ඉටුවිය යුතු යුතුකම් කිහිපයක් පහත දැක්වේ.
ඒවා නිවැරදි ව පහත වගුවේ ඇතුළත් කරන්න.

A සිසුන් මැනවින් හික්මවීම

B දුටුවිට හුනස්නෙන් නැගිටීම

C ගුරු බසට මැනවින් සවන් දීම

D හොඳින් අධ්‍යාපනය ලබාදීම

E දක්ෂතා, හැකියා, විභව්‍යතා හඳුනාගෙන අවශ්‍ය මග පෙන්වීම

F ගුරුවරයාට ප්‍රිය වචනයෙන් කතා කිරීම

G වරද නිවරද පෙන්වමින් සමබර පෞරුෂයක් ගොඩනැගීම

| ගුරුභවතුන්ගෙන් සිසුන්ට ඉටුවිය යුතු යුතුකම් | සිසුන්ගෙන් ගුරුවරුන්ට ඉටුවිය යුතු යුතුකම් |
|---|---|
| ............................................................ | ............................................................ |
| ............................................................ | ............................................................ |
| ............................................................ | ............................................................ |
| ............................................................ | ............................................................ |

(ලකුණු 07)

03) i. ඔබට භුක්ති විඳීමට අයිතිවාසිකම් රාශියක් උරුම වී ඇත. ඒ අතරින් පහත දැක්වෙන අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් ලියා දක්වන්න.

කැමති ආගමක් ඇදහීම →
1. ..........................................................................................
2. ..........................................................................................

අදහස් ප්‍රකාශ කිරීම →
1. ..........................................................................................
2. ..........................................................................................

(ලකුණු 04)

ii. නීතිමය රාමුවක් තුළ අයිතිවාසිකම් භුක්ති විඳීමේ ප්‍රයෝජන (වාසි) 3ක් ලියන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................

(ලකුණු 03)

iii. වෘත්තිකයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා යොදා ඇති විධිවිධාන 4ක් ලියන්න.

1. ............................................ 2. ............................................
3. ............................................ 4. ............................................

(ලකුණු 04)

04) i. යුතුකම් වර්ග කළ හැකි ආකාර අනුව පහත සටහනෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

යුතුකම්

A ................................
- C ............................
- D ............................

B ................................
- E ............................
- F ............................

(ලකුණු 06)

ii. ඔබ ඔබේ පංතියේ නායකයා හෝ නායිකාව යැයි සිතා ඔබෙන් පංති කාමරයට ඉටුවිය යුතු යුතුකම් 3ක් ලියන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................

(ලකුණු 03)

iii. පංති නායකයාගෙන් හෝ නායිකාවගෙන් ඉටුවිය යුතු යුතුකම් නිසිලෙස ඉටු නොවුන විට පංතියට මුහුණදීමට සිදුවන ගැටළු 2ක් ලියන්න.

1. ............................................ 2. ............................................

(ලකුණු 02)

05) i. සංස්කෘතියට අයත් අංග 3ක් නම් කරන්න.

1. ............................................ 2. ............................................ 3. ............................................

(ලකුණු 03)

ii. සංස්කෘතික විවිධත්වයට හේතුවන සාධක 4ක් ලියන්න.

1. ........................................................................ 2. ........................................................................

3. ........................................................................ 4. ........................................................................


(ලකුණු 04)

iii. ශ්‍රී ලාංකික ජන සමාජයේ පවතින බහු සංස්කෘතික ලක්ෂණ 2ක් නිදසුන් සහිතව ලියා දක්වන්න.

| බහු සංස්කෘතික ලක්ෂණ | නිදසුන් |
|---|---|
| 1. ...................................................................... | 1. ...................................................................... <br> 2. ...................................................................... |
| 2. ...................................................................... | 1. ...................................................................... <br> 2. ...................................................................... |

(ලකුණු 04)

06)

| | | | |
|---|---|---|---|
|  A |  B |  C |  D |

ඉහත පින්තූර ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. (අ) ආගම් භේදයකින් තොරව ශ්‍රී ලාංකිකයින් බොහෝ දෙනා දැක වැඳපුදා ගන්නා ස්ථාන දැක්වෙන පින්තූර දෙක නම් කරන්න.

1. ............................................................ 2. ............................................................ (ලකුණු 02)

(ආ) C පින්තූරය හා සම්බන්ධ ආගමික ග්‍රන්ථය කුමක් ද? ............................................................ (ලකුණු 01)

ii. පින්තූර වලින් දැක්වෙන ආගම් සහ ඒ ආගම් ආශ්‍රිත උත්සව ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ආගම | ආගම් ආශ්‍රිත උත්සව |
|---|---|
| A ...................................................................... | 1. ...................................................................... |
| B ...................................................................... | 1. ...................................................................... |
| C ...................................................................... | 1. ...................................................................... |
| D ...................................................................... | 1. ...................................................................... |

(ලකුණු 04)


iii. ජාතික සමගිය ගොඩනැගීම සඳහා තම සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කරගත යුතුය. ඒ සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 4ක් ලියන්න.

1. ........................................................................ 2. ........................................................................


3. ........................................................................ 4. ........................................................................

(ලකුණු 04)

07)



A



B

i. ඉහත A හා B පින්තූර වලින් දැක්වෙන්නේ ජාතික කොඩිය ඔසවා ඇති ආකාර 2කි. එම ආකාර දෙක නිවැරදිව ලියා දක්වන්න.

A ..........................................................................................................................................

B ..........................................................................................................................................

(ලකුණු 02)

ii. වර්තමාන ජාතික කොඩිය නිර්මාණය කිරීම් කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කළ තිදෙනෙක් නම් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

3. .......................................................................................... (ලකුණු 03)

iii. A තීරුවේ දක්වා ඇති ප්‍රකාශ B තීරුවේ දක්වා ඇති ප්‍රකාශ හා නිවැරදිව ගළපා යා කරන්න.

| A | B |
|---|---|
| 1. දේශපාලන අයිතිවාසිකමකි | • A විශ්‍රාම වැටුප් ගෙවීම |
| 2. පුද්ගලයෙකු තුළ තිබිය යුතු උතුම් මානව ගුණාංගයකි | • B සරල අවශ්‍යතා |
| 3. වැඩිහිටි සුරක්ෂිතබව සඳහා රජයගෙන ඇති ක්‍රියාමාර්යකි. | • C ඡන්දය ප්‍රකාශ කිරීම |
| 4. දඩයම් යුගය | • D කලා වැව |
| 5. වර්තමානයේ බොහෝ ජනයා මුහුණ දෙන අභියෝගයකි. | • E සදාචාරාත්මක බව |
| 6. සංස්කෘතික උරුමයකි. | • F ඉහළ යන ජීවන වියදම |

(ලකුණු 06)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 07 - 2023

## පුරවැසි අධ්‍යාපනය

## පිළිතුරු පත්‍රය

rduid

### I - කොටස

| | | | |
|---|---|---|---|
| 01) සමාජයක් | 06) ✓ | 11) iii | 16) හිසතෙල් ගෑම |
| 02) ගෞරවාන්විතව | 07) × | 12) iii | 17) සිංහල හා හින්දු අළුත් අවුරුද්ද |
| 03) මානව | 08) ✓ | 13) i | 18) රාජ්‍ය ලාංඡනය |
| 04) ප්‍රතික්ෂේප | 09) × | 14) iv | 19) ජනාධිපති |
| 05) සංස්කෘතිය | 10) ✓ | 15) ii | 20) වී කරල් - සෞභාග්‍යය පුන්කළස - පරිපූර්ණ බව |

### II - කොටස

01) i. ස්ථාවරවීම / ශක්තිමත් වීම / ගුණවත් වීම (පිටුව 05)

ii. උසස් ගුණාංග / උසස් හැසිරීම් රටා / සුවිශේෂී හැකියාවන්

iii. ශිලභාවනා වැඩසටහන → සංවරබව / ප්‍රියවචන කතා කිරීම / බොරු නොකීම / සංයමය
ශ්‍රමදාන වැඩසටහන → එකමුතුකම / අන් අයට සවන්දීම / සමානාත්මතාවයෙන් කටයුතු කිරීම / නායකත්වය ගරු කිරීම (අදාළ නිවැරදි පිළිතුරු වලට ලකුණු දෙන්න.)

iv. ආර්ථික / කායික / මානසික / සමාජීය (අදාළ නිවැරදි පිළිතුරු වලට ලකුණු දෙන්න.)

v. කල් ඉකුත්වීමේ දිනය / නිෂ්පාදිත දිනය / අඩංගු ද්‍රව්‍යය / ගුණාත්මක බව ආදී නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න.

02) i. A පියා B මව C සහෝදර සහෝදරයෝ D ඥාතීන්

ii. ගුරුභවතුන් - A, D, E, G සිසුන් - B, C F

03) i. කැමති ආගමක් ඇදහීම - වෙනත් ආගම් වලට අවමන් නොකිරීම, ආගමික කණ්ඩායම්වලට හිරිහැර නොකිරීම, වෙනත් ආගම් පිළිබඳ අවබෝධයක් ලබාගැනීම
අදහස් ප්‍රකාශ කිරීම - අන් අයට අපහාස වන ලෙස විවේචන නොකිරීම
හිත් රිදෙන ලෙස කතා නොකිරීම (අදාළ නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න.)

ii.
- සෑම පුද්ගලයෙකුගේම පෞද්ගලික අයිතිය හා නිදහස ආරක්ෂාවීම
- ජනතා අවශ්‍යතා ඉටුවීම
- යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා වර්ධනය වීම
- යහපත් ජීවන ක්‍රමයක් ගොඩනඟාගත හැකි වීම (61, 62 පිටුව)

iii. කම්කරු නීති / සේවක අර්ථසාධක අරමුදල / වැන්දඹු අනත්දරු හා විශ්‍රාම වැටුප් / රක්ෂණ ක්‍රම / මානව හිමිකම් කොමිසම, ආයතන සංග්‍රහය (63 පිටුව)

04) i. A නීතිමය යුතුකම් B සදාචාරාත්මක යුතුකම්
C රජයට අවනත වීම E දෙමාපියන්ට සැලකීම
D බදු ගෙවීම F ආචාරශීලීවීම
(72 පිටුව අදාළ නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න. A, B තීරු මාරු වුවත් නිවැරදි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු දෙන්න.)

ii. පංතිය පිරිසිදු කිරීම බැලීම, නාමලේඛනය, පංති වාර්තා පොත ගෙන ඒම සහ තැබීම පංතිය පිළිවෙළට සකස් කර ගැනීම, නිශ්ශබ්දතාවය ආරක්ෂා කරගැනීම ආදී නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න.

iii. පංතිය අපිළිවෙළ වීම, දෝෂාරෝපනයට ලක්වීම, පංතිභාර ගුරුවරයාගේ සිත රිදීම ආදී නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න.

05) i. ආගම / දැනුම / කලා ශිල්ප / ආහාර / ඇඳුම් පැළඳුම් / භාෂාව / සාහිත්‍යය / සිරිත් විරිත් (80 පිටුව)
ii. ජනවර්ග / ආගම් / භාෂාව / ජීවනෝපාය මාර්ග
iii. ආගම් - බෞද්ධ / ඉස්ලාම් / හින්දු / කතෝලික
ජනවර්ග - සිංහල / දෙමළ / මුස්ලිම් / බර්ගර් / මැලේ (83 පිටුව)

06) i. (අ) B, D (ආ) අල්කුර්ආනය / ශුද්ධ වූ කුරානය
ii. A - බෞද්ධ - වෙසක් / පොසොන් / ඇසළ / සංඝමිත්තා
B - කතෝලික - නත්තල් / පාස්කු
C - ඉස්ලාම් - රාමසාන් / හජ්ජි
D - හින්දු - තෛපොංගල් / දීපාවලී (නිවැරදි උත්සව ලියා ඇත්නම් ලකුණු දෙන්න.)
iii. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම
අන්‍ය සංස්කෘතික දායාදයන් ආරක්ෂා කිරීම
සහජීවනයෙන් කටයුතු කිරීම
අන්‍ය සංස්කෘතීන් පිළිබඳ අවබෝධයක් ලබාගැනීම
(අදාළ නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න.)

07) i. A වීදියක මැද ජාතික කොඩිය එසවීම B $45^0$ කෝණයකින් එසවීම
ii. S. W. R. D. බණ්ඩාරනායක මැතිතුමා / සර් ජෝන් කොතලාවල මැතිතුමා
J. R. ජයවර්ධන මහතා / ටී. බී. ජයා මහතා / ආචාර්ය එල්. ඒ. රාජපක්ෂ මහතා / ජී. ජී. පොන්නම්බලම් මහතා/
ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා
iii. 1 - C 2 - E 3 - A 4 - B 5 - F 6 - D